(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2012 අංක 12 දරන මුදල් පනත**

2013 අංක 12 දරන මුදල් පනතේ III වැනි කොටස මගින් සංශෝධිත, 2012 අංක 12 දරන මුදල් පනතේ IV වැනි කොටස යටතේ මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන නියෝගය.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

2019 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දීය.

**නියෝග**

1. මෙම නියෝග, මුදල් පනතේ - 2019 ශ්‍රී ලංකාවේ වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 1 ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත පරිදි 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය මගින් ස්ථාපිත, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉහත කී නීතියේ 17 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය සහ නව ව්‍යවසායක් අතර එළඹ ඇති ඕනෑම ගිවිසුමක් අන්තර්ගත කර ඇති හෝ නීති ගත කර ඇති 1978 ඔක්තෝබර් මස 31 දිනැති අංක 8/2 දරන *අති විශේෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ, 1978 අංක 01 දරන රෙගුලාසිවල අන්තර්ගතයට අමතරව, 2013 අංක 12 දරන මුදල් පනත මගින් සංශෝධිත පරිදි 2012 අංක 12 දරන මුදල් පනතේ (ප්‍රධාන පනත) IV වැනි කොටසේ දක්වා ඇති විධිවිධාන සම්බන්ධයෙන් බලපැවැත්වෙනු ඇත.

(i) එම නව ව්‍යවසාය, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ක්‍රියාත්මක වන ඕනෑම අනුමත විදේශ විනිමය ගිණුමක් හරහා මෙරටට ප්‍රේෂණය කරනු ලැබූ විදේශ මුදල් ද ඇතුළත්ව මුළු ආයෝජනයෙන් අවම වශයෙන් සියයට හැට පහක් (65%) විදේශීය මූලාශ්‍ර මගින් ආයෝජනය කරන ලැබ, ශ්‍රී ලංකාව තුළ අලුතින් පිහිටුවනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබූ නව ව්‍යවසායක් විය යුතු අතර පහත සඳහන් ව්‍යාපාරික කටයුතු වලින් එකක් හෝ කිහිපයක් මත වූ භාණ්ඩ සහ/හෝ සේවා අපනයනය මත වූ පිරිවැටුම මත රේගු ආඥා පනත (235 අධිකාරය), 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සහ 2013 අංක 12 දරන මුදල් පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි උපලේඛනයෙහි දක්වා ඇති පනත් හි විධිවිධානයන් අදාළ කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(අ) අන්තරාල වෙළඳාම සම්බන්ධයෙන් ;

i) ආනයනයන්, සුළු පිරිසැකසුම් කර ප්‍රතිඅපනයනය කිරීම ;

ii) විශේෂිත බන්ධිත ප්‍රදේශයක ස්ථාපිත සහ ප්‍රධාන ප්‍රඥප්තියෙහි අර්ථ දක්වා ඇති පරිදි අපනයන සඳහා වූ ඕනෑම නිෂ්පාදන කටයුත්තක්

*(ආ)* එක් රටකින් සපයා ගනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ, ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක් වෙරළ ව්‍යාපාර,

(ඇ) විදේශීය සේවාදායකයින් හට පෙර නිමි සේවාවන් සැපයීම,

(ඈ) මූල්‍ය සැපයුම්දාම කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මඟින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදුකිරීම,

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රට වලින් ආනයනය කරන ලද භාණ්ඩ සංගෘහිත කිරීම් වැනි සැපයුම් සේවා සිදුකිරීම

තවදුරටත්, යම් ව්‍යවසායක් මෙම නියමයන්හි 2(1) (අ) (ii) යටතේ සඳහන් ව්‍යාපාර කටයුත්තක නිරතව සිටින්නේ නම් සහ එම භාණ්ඩ/නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුමෙන් සියයට 65 කට වඩා වැඩි ප්‍රමාණයකින් රට තුළට කරනු ලබන ආනයන වලින් සපුරා තිබේ නම් එවැනි අවස්ථාවකදී සහ ජාතික ආර්ථිකයේ අවශ්‍යතාවය මත දේශීය වෙළඳපොළ තුළ එවැනි භාණ්ඩ/නිෂ්පාදනවල පැවතීමේ වැදගත්කම සලකමින් එවැනි ව්‍යවසාය සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වයක් සමඟින් අමාත්‍ය මණ්ඩලය මඟින් දීර්ඝ කිරීමකින් මිස දේශීය වෙළඳපොළට පිවිසීමේ අනුමැතිය ලත් දින සිට අවුරුදු අටක (08) උපරිම කාලයක් සඳහා වාර්ෂික සැසඳීම් පදනමට යටත්ව එකී ව්‍යවසායේ වාර්ෂික ප්‍රතිඅපනයන පිරිවැටුමෙන් (නිෂ්පාදනාගාර වටිනාකම) උපරිම සියයට 40 (40%) ක් දක්වා එම භාණ්ඩ/නිෂ්පාදන දේශීය වෙළඳපොළට විකිණීමට ඉඩ ලබාදෙනු ඇත.

කෙසේ වුවද, ඉහත සහනය යටතේ වන දේශීය වෙළඳපොළ ප්‍රවේශය ඕනෑම මෝටර් රථ ඉන්ධන, ද්‍රව පෙට්‍රෝලියම් වායුව, ප්‍රොපේන්, බියුටේන් සහ පොහොර හෝ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරනු ලබන ඕනෑම වෙනත් භාණ්ඩ සඳහා සීමා විය යුතුය. ඉහත සහනය යටතේ දේශීය වෙළඳපොළට ප්‍රවේශලත් ඕනෑම ව්‍යවසායක් දේශීය වෙළඳපොළට නිදහස් කරන එවැනි භාණ්ඩ/නිෂ්පාදන මත සියලුම බදු ගෙවිය යුතුය. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම ව්‍යවසාය ආදායම් බදු සහ ආදායම මත අනෙකුත් අදාල බදු ගෙවීම් කළ යුතුය.

වර්ෂය තුළ දේශීය වෙළඳපොළට කරන ලද විකුණුම් වටිනාකම වර්ෂය තුළ අපනයන පිරිවැටුම සමග වාර්ෂික පදනමින් සැසඳීමට අසමත් වන ව්‍යවසායක්, එම ව්‍යවසායේ ප්‍රථම වාණිජ වෙළඳාම සිදුකරන ලද දිනයේ සිට සලසන ලද පළමු අවුරුදු හතර (04) ක කාලය තුළ එම නොසසඳන ලද දේශීය අලෙවි වටිනාකම ඉදිරියට ගෙනයාම සඳහා ඉඩ ලබාදිය යුතු අතර ඉන්පසු එම ව්‍යවසාය සඳහා වන දේශීය වෙළඳපොළ ප්‍රවේශය නොසසඳන ලද දේශීය අලෙවි වටිනාකම අයත්නම් එම ප්‍රමාණයට විය යුතුය.

කෙසේ වුවද :-

(i) ඉහත (අ) සහ (ඉ) යටතේ දක්වා ඇති ව්‍යාපාරවල නියුතු සහ ද්‍රව්‍යමය වශයෙන් භාණ්ඩ ආනයනයෙහි නියුතුවීම, වෙළෙඳ භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ප්‍රතිඅපනයනය කිරීම වැනි ව්‍යාපාර කටයුතුවල නියුතු නව ව්‍යවසායන් එම කටයුතු නිදහස් වරායක් තුළ හෝ බන්ධිත ප්‍රදේශයක මෙහෙයවිය යුතුය. කෙසේ වුවද, ප්‍රධාන ප්‍රඥප්තියෙහි අර්ථකථනය කර ඇති පරිදි අන්තරාල වෙළෙඳාමෙහි නියුක්ත වන්නේ නම්, මෙම නියමයන් යටතේ භාණ්ඩයක් නිෂ්පාදනයට අනුමැතිය ලබා ඇත්නම්, එබඳු ව්‍යවසායක් විශේෂයෙන් සඳහන් කළ විශේෂිත බන්ධිත ප්‍රදේශයක හෝ නිදහස් වරායක පමණක් මෙහෙයුම් කටයුතු කළ යුතුය.

(ii) ඉහත (ආ), (ඇ) සහ (ඈ) යටතේ දක්වා ඇති ව්‍යාපාර කටයුතුවල නියැලි නව ව්‍යවසායක් නිදහස් වරායෙන් හෝ බන්ධිත ප්‍රදේශයෙන් පිටත ස්ථාපිත කළ හැකිය.

(iii) ඉහත (අ) යටතේ දක්වා ඇති ව්‍යාපාරික කටයුතුවල නියුතු වන නව ව්‍යවසායක් විසින් අවමය සියයට 50 ක් වශයෙන් අවම ආයෝජනය එ.ජ.ඩො. මිලියන පහක් (එ.ජ.ඩො. මිලියන 05) ස්ථාවර වත්කම්වල ආයෝජනයක් කළ යුතු අතර එම ආයෝජනය, ව්‍යවසාය සහ මණ්ඩලය අතර අදාළ ගිවිසුම අත්සන් කළ දින සිට මාස දොළහක් (12) ඇතුළත ප්‍රේෂණය කළ යුතුය. එසේම, එබඳු ව්‍යවසායක් ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර පහක් පුරා අවස්ථානුකූලව වාර්ෂික ප්‍රතිඅපනයන හෝ අපනයන පිරිවැටුම එ.ජ.ඩො. මිලියන 20 ට නොඅඩුව පවත්වා ගත යුතුය.

(iv) ඉහත (ඉ) යටතේ දක්වා ඇති ව්‍යාපාරික කටයුතුවල නියුතු වන නව ව්‍යවසායක් විසින් අවමය සියයට 30 ක් වශයෙන් අවම ආයෝජනය එ.ජ.ඩො. මිලියන තුනක් (එ.ජ.ඩො. මිලියන 03) ස්ථාවර වත්කම්වල ආයෝජනය කළ යුතු අතර, එම ආයෝජනය, ව්‍යවසාය සහ මණ්ඩලය අතර අදාළ ගිවිසුම අත්සන් කළ දින සිට මාස දොළහක් (12) ඇතුළත ප්‍රේෂණය කළ යුතුය. එසේම, එබඳු ව්‍යවසායක් ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර පහක් පුරා අවස්ථානුකූලව වාර්ෂික ප්‍රතිඅපනයන හෝ අපනයන පිරිවැටුම එ.ජ.ඩො. මිලියන 15 ට නොඅඩුව පවත්වා ගත යුතුය.

(v) ඉහත (ආ), (ඇ) සහ/හෝ (ඈ) යටතේ දක්වා ඇති ව්‍යාපාරික කටයුතුවල නියුතු වන නව ව්‍යවසායක් විසින් අවමය සියයට 40 ක් වශයෙන් අවම ආයෝජනය එ.ජ.ඩො. මිලියන එකක් (එ.ජ.ඩො. මිලියන 1) ස්ථාවර වත්කම්වල ආයෝජනය කළ යුතු අතර, එම ආයෝජනය, ව්‍යවසාය සහ මණ්ඩලය අතර අදාළ ගිවිසුම අත්සන් කළ දින සිට මාස දොළහක් (12) ඇතුළත ප්‍රේෂණය කළ යුතුය. එසේම, එබඳු ව්‍යවසායක් ව්‍යාපාරික මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර පහක් පුරා අවස්ථානුකූලව වාර්ෂිකව ප්‍රතිඅපනයන හෝ අපනයන පිරිවැටුම එ.ජ.ඩො. මිලියන 10 ට නොඅඩුව පවත්වා ගත යුතුය.

(vi) මෙම නියමයන් යටතේ අනුමත කරමින් යම්කිසි ව්‍යවසායක් මගින් ප්‍රතිඅපනයන අරමුණ සඳහා ගෙනෙන ලද ඕනෑම භාණ්ඩ/නිෂ්පාදන, එම භාණ්ඩ/නිෂ්පාදන ආනයනය/ළගා වූ දින සිට මාස දහ අට (18) කට වඩා වැඩි කාලයක් ගබඩා හෝ ගුදම්ගත නොකළ යුතුය. එලෙස යම් ව්‍යවසායක් එම භාණ්ඩ/නිෂ්පාදන මාස දහ අටකට වඩා වැඩි කාලයක් ගබඩා/ගුදම්ගත කර තිබුණේ නම් රේගු ආඥා පනතේ විධිවිධාන පරිදි මාස දහ අට (18) සම්පූර්ණ කරන ලද දින සිට දින තිහක් (30) ක් ඇතුළත ප්‍රතිඅපනයනය කිරීමට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ උපදෙස් සමගින් මණ්ඩලය විසින් එම ව්‍යවසායට නියම කළ යුතුය.

3. 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික කටයුතුවල නිරත වන ව්‍යවසායක් මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද ආකෘති පත්‍ර මගින් සිය සියලු ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක පැහැදිළි වාර්තා පවත්වා ගත යුතු අතර, ඊට සියලු අභ්‍යන්තර හා බාහිර විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් පිළිබඳ තොරතුරු අන්තර් ගත විය යුතු සේම එම වාර්තා වාර්ෂිකව මණ්ඩලය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම, මණ්ඩලය හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීම පහසු වීම පිණිස ඕනෑම අවස්ථාවක සිට පසුපසට වසර හයක කාලයක් දක්වා මෙම වාර්තා අදාළ ව්‍යවසායේ මෙහෙයුම් කටයුතු සිදු කරන ස්ථානයේ පවත්වාගෙන යා යුතුය.

4. 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික කටයුතුවල නිරත වන නව ව්‍යවසායේ, අවශ්‍ය වන පරිදි ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිදහස් වරාය හෝ බන්ධිත ප්‍රදේශ හෝ විශේෂිත බන්ධිත ප්‍රදේශ සම්බන්ධයෙන් එක්ව සිදු කළ හැකි මෙහෙයුම් ක්‍රියාමාර්ගයන්ට යටත් විය යුතුය.

5. යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති විට හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කර ඇති විට, එම භාණ්ඩය ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය වෙත හෝ ඉන් පිටතට ගෙනයන අවස්ථාවක දී අදාළ පරිදි රේගු ආඥා පනතේ සහ ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන අදාළ විය යුතුය.

6. එකතු කළ අගය මත බද්ද හෝ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා වන අරමුණින් මෙම නියමයන් යටතේ ඉහත 2 (1)(අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ දක්වා ඇති ව්‍යාපාර කටයුතු වල නිරත වන ව්‍යවසායකට ඕනෑම භාණ්ඩ සැපයුමක් අපනයන ලෙස සැලකිය යුතුය.

7. පහත කරුණු සම්බන්ධයෙන් වන ප්‍රතිනැව්ගත කිරීම් හෝ ඕනෑම ප්‍රතිඅපනයන ව්‍යාපාර/කටයුතු වලට වන ප්‍රවර්ධන සේවාවන් සඳහා වන විධිවිධාන සහ/හෝ අන්තරාල කටයුතු වල නිරත වන ඕනෑම ව්‍යවසායකට මෙම නියමයන් යටතේ අනුමැතිය ලබා නොදිය යුතුය.

(අ) ගම්මිරිස්, පුවක්, සාදික්කා/වසාවාසි, සියඹලා, කුරුඳු, කරාබු නැටි, ඉඟුරු, කහ සහ කරදමුංගු වැනි කුළු බඩු සහ ආශ්‍රිත නිෂ්පාදන

(ආ) අපද්‍රව්‍ය සහ/හෝ අපද්‍රව්‍ය සැකසීම හෝ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාර

8. මෙහි සඳහන් කුමන ආකාරයකින් නිදහස් කිරීම් ලබා දී තිබුණ ද, මෙම නීති මාලාව අදාළ වන සියලුම ව්‍යවසායන් රේගු ආඥාපනතේ උපලේඛනය (ආ) යටතේ පනවා ඇති සීමා කිරීම් සහ තහනම් කිරීම් සඳහා යටතේ වේ. රේගු ආඥා පනතේ උපලේඛනය (ආ) යටතේ පනවා ඇති සීමා කිරීම් සහ තහනම් කිරීම්වලට එරෙහිව යමින් යම් ව්‍යවසායන් කටයුතු කරන්නේ නම්, මෙම නීති මාලාවට අදාළ වන ඕනෑම ව්‍යාපාරික ස්ථානයක් වෙත ඇතුළු වීමට සහ අවශ්‍ය පියවර ගැනීමට රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරනු ලැබූ ඕනෑම නිලධාරියෙකු වෙත බලය ඇත.

9. කෙසේ වුවද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු, 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන ගැසට් නිවේදනයේ උපලේඛනයේ (1) හි අ 4 වගන්තිය මගින් පනවා ඇති "සීමාවන්" මෙම ව්‍යවසාය සඳහා අදාළ නොවන අතර එබැවින් මෙම ව්‍යවසායන්හි විදේශීය අයිතිවාසිකම් සඳහා අවසර දිය හැකිය.

10. මෙම නියෝගය යටතේ දක්වා ඇති ඕනෑම ව්‍යවසායක් සඳහා බන්ධිත ප්‍රදේශවලට සහ නිදහස් වරායට ඇතුළු වන දේශීය අපනයනවලට පමණක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ප්‍රභවස්ථාන සහතිකය (Country of Origin Certificate) නිකුත් කරනු ලැබේ.

11. සංශෝධිත පරිදි 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2 (iii) වගන්තියේ විධිවිධාන යටතේ කොළඹ සහ හම්බන්තොට වරායන්, මෙම නියෝගයෙහි අවශ්‍යතාවයන් සඳහා නිදහස් වරායන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

12. සංශෝධිත පරිදි 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත මගින් ප්‍රකාශිත කටුනායක අපනයන සැකසුම් කලාපය සහ කොග්ගල අපනයන සැකසුම් කලාපය, මෙම නියෝගයෙහි අවශ්‍යතාවයන් සඳහා බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

13. 1955 ගුවන් සන්තරණ රෙගුලාසි යටතේ 2013 පෙබරවාරි මස පළමුවැනි දින අංක 1795/52 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 126 වැනි නියමය යටතේ ප්‍රකාශිත සහ රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 111 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2013 මාර්තු 07 දිනැති අංක 1800/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 'අ' උපලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව මත්තල පිහිටි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් ප්‍රකාශිත මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය අන්තරාල ක්‍රියාකාරකමක් වශයෙන් ප්‍රධාන පනතේ අර්ථ දක්වා ඇති අගය එකතු කරන ලද නිෂ්පාදන කටයුතු අවශ්‍යතාවයන් සඳහා විශේෂිත බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

14. කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙම නියෝගයන්හි අවශ්‍යතාවයන් සඳහා බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

15. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද ඕනෑම ලිපියක් හෝ නියෝගයක් සමඟින් 2013 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 01, මෙම නියෝග යටතේ නියෝග අංක 01 යටතේ කරන ලද කිසිවක වලංගුභාවයට හානියක් නොමැති පරිදි 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 1 ප්‍රකාශයට පත්කළ දින සිට බලාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ.